# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2363/71 – 2023 දෙසැම්බර් මස 22 වැනි සිකුරාදා – 2023.12.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/02/2020/270.

**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණයේ) ව්‍යවස්ථාපිත අණපනත්වල (131 ව පරිච්ඡේදය වන) කාර්මික අරාවුල් පනත.**
**4(1) වගන්තිය යටතේ දුන් නියෝගය අවලංගු කිරීම**

1957 අංක 14 සහ 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 ( 1968 අංක 37 දරන කාර්මික ආරාවුල් ( විශේෂ විධිවිධාන ) පනත සමග කියවෙන) පනත් වලින් සංශෝධිත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2023.06.28 වන දින අංක 2338/36 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ *ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2023.06.22 වැනි දින දරන නියෝගයෙන්,

1 එම්. ජේ. චන්ද්‍රසේන මයා,
අංක 217/25,
සිරිල් ජැන්ස් මාවත,
පානදුර.

2 බී. චන්ද්‍රසේකර මයා,
අංක 35/5,
සමඟි මාවත,
දෙපානම,
පන්නිපිටිය.

සහ

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය,
චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත,
කොළඹ - 02.

1A – G 41092 – 11 (2023/12)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

අතර පවත්නා 2023.06.07 දින දරන කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ සඳහන් කරන ලද කරුණු පිළිබඳව වූ කාර්මික ආරාවුල් බේරුම් කිරීමෙන් සමථයට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් නීතීඥ එස්. ඒ. නිමල් සරණතිස්ස මයා වෙත යොමු කරන ලදී.

බේරුම්කරු නීතීඥ එස්. ඒ. නිමල් සරණතිස්ස මයා බේරුම්කාර ධූරයෙන් ඉල්ලා අස්වන බව දන්වා ඇත. එබැවින් යථෝක්ත නියෝගය අවලංගු කළයුතු යැයි පෙනී යන හෙයින් කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනූෂ නානායක්කාර වන මා එම නියෝගය අවලංගු කරන අතර එකී 2023.06.22 දින දරන නියෝගය මත ක්‍රියා නොකරන ලෙසද මෙයින් නියෝග කරමි.

**මනූෂ නානායක්කාර,**
කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය.

2023 දෙසැම්බර් මස 15 වැනි දින,
කොළඹදී ය.

EOG 12 -0333/1

---

මගේ අංකය: IR/COM/02/2020/270.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ**
4(1) වන වගන්තිය යටතේ නියෝගය

**මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව.**

1 එම්. ජේ. චන්ද්‍රසේන මයා,
අංක 217/25,
සිරිල් ජැන්ස් මාවත,
පානදුර.

2 බී. චන්ද්‍රසේකර මයා,
අංක 35/5,
සමගි මාවත,
දෙපානම,
පන්නිපිටිය.

සහ

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය,
චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත,
කොළඹ - 02.

*අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,*

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනූෂ නානායක්කාර වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල් බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් මත්තේගොඩ, කුඩමාඩුව, ද විලේජ්, 202/බී/61 නීතීඥ විජේසුන්දර ආරච්චිගේ ජයවික්‍රම මහතා පත් කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**මනූෂ නානායක්කාර,**
කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය.

2023 දෙසැම්බර් මස 15 වැනි දින.
කොළඹ දීය.

මගේ අංකය: IR/COM/02/2020/270.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරය වන කාර්මික ආරාවුල් පනත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය).**

1 එම්. ජේ. චන්ද්‍රසේන මයා,
අංක 217/25,
සිරිල් ජැන්ස් මාවත,
පානදුර.

2 බී. චන්ද්‍රසේකර මයා,
අංක 35/5,
සමගි මාවත,
දෙපානම,
පන්නිපිටිය.

සහ

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය,
චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත,
කොළඹ - 02.

**ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතුවී පවත්නා කරුණු**

"ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සේවකයින් වන එම්. ජේ. චන්ද්‍රසේන මහතාට සහ බී. චන්ද්‍රසේකර මහාතාට කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 30 ක්‍රියාත්මක කිරීමේදී පහත කරුණු මගින් අසාධාරණයක් සිදුව තිබේ යුතු සහනයන් කවරේ ද යන්න පිළිබඳව වේ".

1. තනතුරු නාමය වෙනස් වීම
2. වැටුප් විෂමතාවයක් සිදුව තිබේ නම් එසේ විෂමතාවයක් ඇතිවීම
3. උසස්වීම් ලබා දීමේදී ආයතනය කටයුතු කර ඇති ආකාරය

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2023 දෙසැම්බර් මස 05 වැනි දින,
කොළඹ කම්කර කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේදී දින යොදන ලදි.

EOG 12 - 0333/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.